# මිල ගණන් කැඳවීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - 2018

## භාවිතයෙන් ඉවත් කෙරුනු අබලි ද්‍රව්‍ය හා අතිරික්ත භාණ්ඩ මිලට ගෙන ඉවත් කරගැනීම

1. භාවිතයෙන් ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය හා අතිරික්ත භාණ්ඩ කාණ්ඩ දාහතක් (17) මිලට ගෙන ඉවත් කරගැනීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලබන අතර මෙම කාණ්ඩවල පැරණි මේස, කබඩ්, පුටු, රාක්ක, විදුලි පංකා, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, කඩදාසි කපන යන්ත්‍ර (paper shredders), ගණක යන්ත්‍ර, දුරකතන හා ෆැක්ස් යන්ත්‍ර ආදියද ඇතුළත් වේ.
2. ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01 ප්‍රධාන ගොඩනැගිලි පරිශ්‍රය තුළදී කාණ්ඩ අංක 08 සිට 17 දක්වා සහ බැංකු විදු පියස, අංක 58, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය පරිශ්‍රය තුළදී කාණ්ඩ අංක 01 සිට 07 දක්වා **2018.03.21 දින සිට 2018.03.29** දින තෙක් **පෙරවරු 09.00 - පස්වරු 03.00** කාලය අතරතුර පරීක්ෂා කර බැලිය හැකි අතර ඒ සඳහා සේවක අර්ථසාධක අරමුදල් (සේ.අ.අ.) දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී හට (දු. ක. 011-2477962, 011-2477968 ඔස්සේ) පූර්ව දැනුම්දීමක් කළ යුතුය.
3. ලංසු/ ටෙන්ඩර් හා අදාල ලියකියවිලි අංක 13, සර් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01හි පිහිටි ලොයිඩ්ස් ගොඩනැගිල්ලේ මහජන සම්බන්ධතා හා විමසීම් කවුළුව වෙතින් **2018.03.21 සිට 2018.03.29** දක්වා දිනයන්හි **පෙරවරු 09.00 සිට පස්වරු 03.00** දක්වා නොමිලේ ලබාගත හැකිය.
4. මහ බැංකු සේවකයන්ට හෝ ඔවුන්ගේ ඥාතීන් හට මිල ගණන් ඉදිරිපත් කිරීමට අවසර නොමැත. ටෙන්ඩර් ලේඛනයේ ඇමුණුමේ දක්වා ඇති පරිදි ලංසුකරුවන්ට කාණ්ඩ එකකට හෝ වැඩි ගණනක් සඳහා ඔවුන්ගේ මිල ගණන් ඉදිරිපත් කළ හැකි අතර සහ එක් ටෙන්ඩර්කරුවෙකුට ඉරිපත් කළ හැක්කේ එක් ටෙන්ඩර් ලියකියවිල්ලක් පමණි.
5. ලංසු විවෘත කරන ලද දින සිට දින **60ක්** වලංගු වන, "අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල" නමට ලියන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ලබාගත් **රු. 5,000ක** වටිනාකමකින් යුත් (රුපියල් පන්දහසක) මුදලක බැංකු අණකරයක් සෑම ලංසුවකටම අමුණා තිබිය යුතුය.
6. ලංසු ඉදිරිපත් කරන ආරක්ෂිතව මුද්‍රා තබන ලද ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ භාවිතයෙන් ඉවත් කෙරුනු අබලි ද්‍රව්‍ය හා අතිරික්ත භාණ්ඩ මිලට ගෙන ඉවත් කරගැනීමේ ටෙන්ඩරය"** ලෙස සඳහන් කර, ලොයිඩ්ස් ගොඩනැගිල්ලේ, මහජන සම්බන්ධතා හා විමසීම් කවුළුවෙහි තබා ඇති ටෙන්ඩර් බහාලුමට **2018.04.04** දින **පස්වරු 03.00** ට පෙර ගෙනවිත් බහාලීම හෝ ලියාපදිංචි තැපෑල ඔස්සේ අධිකාරී, සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට **2018.04.04** යන දින **පස්වරු 03.00** ට පෙර ලැබෙන සේ තැපැල් කිරීම කළ යුතුය.
7. ටෙන්ඩර්පත් භාර ගැනීම **2018.04.04** දින **පස්වරු 03.00** ට අවසන් කර එසැනින්ම, ප්‍රධාන ගොඩනැගිල්ලේ 12 වන මහලෙහි 4 වන කුළුණෙහි සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ ලංසු විවෘත කරනු ලැබේ. ශ්‍රී ලංකා මහා බැංකුවේ ආරක්ෂිත විධිවිධානයන්ට යටත්ව ටෙන්ඩර්කරු හෝ බලයලත් නියෝජිතයෙකුට ඒ සඳහා සහභාගී විය හැකිය.
8. වැඩිදුර තොරතුරු දැනගැනීමට අවශ්‍ය වෙතොත් දුරකථන අංක 011-2477962 හෝ 011-2477969 ඔස්සේ සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී විමසන මෙන් ඉල්ලා සිටිමු.

**අධිකාරී - සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

011-2477962 / 011-2477969 sepf@cbsl.lk www.epf.lk